00024

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

අධ්‍යාපනවේදී (නාට්‍ය හා රංගකලා)උපාධි වැඩසටහන-පස්වන මට්ටම 2018/2019

අවසාන පරීක්ෂණය - 2019

අධ්‍යාපනයේ පදනම - ESU3226/STU5526

කාලය පැය තුනයි. (03)

---

දිනය - 2019.02.12 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

**1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

## 1 වන කොටස

01. "අධ්‍යාපනය යනු ළමයා සහ වැඩිහිටියා තුළ ශාරීරික, මානසික හා ප්‍රාණේද්‍රිය වශයෙන් උසස් තත්ත්වයක් ඉවතට මතු කර දීමයි." - මහත්මා ගාන්ධි.

    ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේ ද? හේතු දෙකක් (02) දක්වන්න.

02. "අධ්‍යාපන දර්ශනය" යනුවෙන් හඳුන්වන්නේ කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

03. නොවිධිමත් අධ්‍යාපනයේ දැකිය හැකි විශේෂ ලක්ෂණ නම් කරන්න.

04. සමාජ සචලතාව සම්බන්ධ ප්‍රධාන කොටස් දෙක උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

05. අධ්‍යාපන පරමාර්ථ සහ අරමුණුවල වෙනස සැකෙවින් පැහැදිලි කරන්න.

06. ද්විතියික සමාජානුයෝගී කාරකයක් වශයෙන් පාසලේ භූමිකා තුනක් (03) සඳහන් කරන්න.

07. ශ්‍රී ලාංකීය සමාජය තුළ දැකිය හැකි සමාජ ස්ථරායන වර්ග දෙකක් (02) නම් කර ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න.

08. සංවර්ධනය වෙමින් පවතින රටක් ලෙස ශ්‍රී ලංකාව මුහුණ දෙන අධ්‍යාපන ගැටලු පහක් (05) නම් කරන්න. (ලකුණු 5 x 8 = 40)

## 2 වන කොටස

09. (i) පුද්ගල දෘෂ්ටිකෝණය අනුව අධ්‍යාපනයෙන් අපේක්ෂා කරන කාර්යයන් හතරක් **(04)** නම් කරන්න. (ලකුණු 04)

(ii) ප්ලේටෝ විසින් ඉදිරිපත් කළ අධ්‍යාපන දර්ශනය තුළ ඇතුළත් ප්‍රධාන අරමුණු නම් කර අධ්‍යාපන ක්‍රියාවලියේ දී එහි ඇති වැදගත්කම සාකච්ඡා කරන්න.

(ලකුණු 08)

(iii) ප්ලේටෝ යෝජනා කළ ඉගැන්වීම් ක්‍රම තුනක් **(03)** නම් කර ඉන් එකක් නාට්‍ය හා රංගකලා විෂයය තුළ භාවිත කළ හැකි ආකාරය සුදුසු නිදසුන් ඇසුරෙන් විභාග කරන්න. (ලකුණු 08)

10. (i) 'සාරධර්ම' සහ 'සදාචාරය' අතර ඇති සමීප සම්බන්ධතාව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) 'ජීවන දර්ශනය' යනු කුමක්දැයි නිර්වචනය කර යහපත් ජීවන දර්ශනයක් ගොඩනගා ගැනීමට අධ්‍යාපනය දායක වන ආකාරය සාකච්ඡා කරන්න.

(ලකුණු 08)

(iii) පාසලේ දී සාරධර්ම සංවර්ධනය සඳහා නාට්‍ය හා රංගකලා ගුරුවරයකුට ගත හැකි සුවිශේෂී ක්‍රියාමාර්ග තුනක් **(03)** පැහැදිලි කරන්න. (ලකුණු 08)

11. (i) සුවිශේෂී අධ්‍යාපන අරමුණක් යනු කුමක්දැයි නිදසුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) රටක අධ්‍යාපන අරමුණු ප්‍රකාශ කිරීමේ ඇති වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) ශ්‍රී ලංකාවේ ද්විතියික අධ්‍යාපන විෂයමාලාවේ නාට්‍ය හා රංගකලා විෂයය ධාරාව සඳහා ඇතුළත් විය යුතු අධ්‍යාපන පරමාර්ථ හතරක් **(04)** යෝජනා කරන්න. (ලකුණු 08)

12. (i) "ප්‍රාථමික සමාජානුයෝජනය" යන සංකල්පය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) සමාජානුයෝගීකාරකයක් වශයෙන් පවුලේ භූමිකාවේ ඇති වැදගත්කම විශ්ලේෂණය කරන්න. (ලකුණු 08)

(iii) සිසුන් සමාජානුයෝගි කිරීමේ දී නාට්‍ය හා රංගකලා ගුරුවරයකු ලෙස ඔබ මුහුණ දෙන ගැටලු තුනක් **(03)** දක්වා එම ගැටලු මඟහරවා ගැනීමට සුදුසු යෝජනා ඉදිරිපත් කරන්න. (ලකුණු 08)

13. (i) "සමාජ පංතිය" යන සංකල්පය නිර්වචනය කරන්න. (ලකුණු 04)

(ii) වර්තමාන ශ්‍රී ලාංකීය සමාජයේ දැකිය හැකි සමාජ පංති තුනක් **(03)** නම් කර ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) සමාජ සචලතාව හා සමාජ පන්තිය අතර පවතින සම්බන්ධතාව නිදසුන් තුනක් **(03)**ඇසුරින් සාකච්ඡා කරන්න. (ලකුණු 08)

14. (i) අධ්‍යාපනය හා සංවර්ධනය අතර ඇති සම්බන්ධතාව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) සංවර්ධනය වන රටක් ලෙස ශ්‍රී ලංකාවේ දැකිය හැකි සංවර්ධිත ලක්ෂණ තුනක් **(03)** නම් කර ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 08)

(iii) අනිවාර්ය අධ්‍යාපනය ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකාවට ගත හැකි ක්‍රියා මාර්ග යෝජනා කරන්න. (ලකුණු 08)

හිමිකම් ඇවිරිණි.